# කෝට්ටේ රාජධානි සමයෙහි වහල්භාවය, භික්ෂුව හා විහාරාරාම මඟින් ප්‍රයෝජනයට ගනු ලැබූ ශ්‍රම වර්ගයක් වී ද යන්න පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

එම්. ඒ. ප්‍රසාද් කුමාර[1], ශාලිකා කුරුණෑයක[2]

## පර්යේෂණ හැඳින්වීම

15 වන සියවසේ විහාරස්ථ ඉඩම් හිමිකම පිළිබඳ ව සලකා බලනවිට අනාවරණය වන වැදගත් තත්ත්වයක් නම් ප්‍රදානය කරන ලද ඉඩමේ අයිතිය පමණක් නො ව ඉඩම තුළ නිත්‍යවාසී නිවැසියන්ගේ, සත්වයන්ගේ සහ ගහකොළවල අයිතිය ද විහාරය සන්තක වීමේ සම්ප්‍රදාය යි. රජවරුන් මෙසේ දාසයින් විහාරවලට ප්‍රදානය කිරීම ගැන කර ඇති සඳහන්වලින් පැන නඟින අදහසක් නම් වහල්භාවය විහාර මඟින් ප්‍රයෝජනයට ගනු ලැබූ ශ්‍රම වර්ගයක් වීය යන්න යි. එහෙත් යුරෝපීය වැඩවසම් සමාජය තුළ වහලුන් භුක්ති විඳි පීඩාකාරී තත්ත්වයන් කෝට්ටේ විහාරස්ථ ඉඩම් භුක්ති ක්‍රමය තුළ විහාර දාසයින් අත්පත් කරගත්තේ නැත. බලහත්කාරයෙන් හෝ තර්ජනයේ යෙදවීමෙන් දාසයින් ලවා තම ඉඩම් වගා කරවීමට විහාරය නො පෙළඹුණු අතර, විහාරස්ථ ඉඩම්වල වාසය කරන ලද නිවැසියන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කරමින් මානුෂීය අඳැමින් ඉඩම් භුක්තිය හැසිරවීම විහාරස්ථ දේපොළ සංවිධානය තුළ කැපී පෙනෙන ලක්ෂණයක් විය. කෝට්ටේ රාජධානි සමයෙහි වහල්භාවය භික්ෂුව හා විහාරාරාම මඟින් ප්‍රයෝජනයට ගනු ලැබූ ශ්‍රම වර්ගයක් වී ද යන්න පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් මෙම පර්යේෂණයෙන් සිදු කෙරේ.

## පර්යේෂණ අරමුණු

කෝට්ටේ රාජධානි සමයෙහි වහල්භාවය භික්ෂුව හා විහාරාරාම මඟින් ප්‍රයෝජනයට ගනු ලැබූ ශ්‍රම වර්ගයක් වී ද යන්න අධ්‍යයනය කිරීම හා කෝට්ටේ විහාරස්ථ ඉඩම් භුක්තික්‍රමය තුළ විහාර දාසයින් අත්පත් කරගත් තත්ත්වය සොයා බැලීම මෙහි අරමුණ වේ.

## පර්යේෂණ ක්‍රමවේදය

මෙම අධ්‍යයනය සිදු කිරීමේ දී මූලික වශයෙන් පුස්තකාල අධ්‍යයනය කරන ලද අතර, ඒ යටතේ ප්‍රස්තුතයට අදාළ ව මෙතෙක් පළ වී ඇති ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රය අධ්‍යයනයට ලක් කෙරිණි. 15 වන සියවසේ පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය, කොළඹ සහ මහනුවර රාජ්‍ය ලේඛනාගාරයන්හි තැන්පතු ලේඛන, යුගයට අදාළ සන්නස්, තුඩපත් හා විදේශිකයන්ගේ වාර්තා, රැසක් අධ්‍යයනයට ලක් කෙරිණි. එම සියලු දත්ත පදනම් කොටගෙන ප්‍රස්තුතය විචාරාත්මක ප්‍රවේශයකින් සාකච්ඡාවට බඳුන් කිරීම මෙහි ක්‍රමවේදය වෙයි.

[1]. කථිකාචාර්ය, මානවශාස්ත්‍ර අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය. *prasadmallawaarachchi85@gmail.com*
[2]. කථිකාචාර්ය, පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය.

**පර්යේෂණ ගැටලුව**

කෝට්ටේ රාජධානි සමයෙහි වහල්භාවය විහාර මගින් ප්‍රයෝජනයට ගනු ලැබූ ශ්‍රම වර්ගයක් වී ද? යන්න මෙහි පර්යේෂණ ගැටලුව වේ.

**පර්යේෂණ සාහිත්‍ය විමර්ශනය**

මහාචාර්ය, මැන්දිස් රෝහණධීරයන් විසින් රචනා කරන ලද 'සාංඝික දේපළ' නම් කෘතියෙහි විහාර සන්තක දේපොළ, වහල් දාසිදස් පිරිවර, විහාර දේපොළ පරිහරණය පිළිබඳ ව සාකච්ඡා කර ඇත. රණවීර ගුණවර්ධනයන් විසින් රචිත 'සිවුර සහ නඟුල' පර්යේෂණ ග්‍රන්ථය ද පුරාතන ලංකාවේ විහාර ඉඩම් භුක්තිය පිළිබඳ අධ්‍යයනයේ දී උපකාරිත සුවිශේෂී පර්යේෂණ නිබන්ධයකි. එහෙත් ප්‍රස්තුත මාතෘකාව අවධානයට ලක් වී නැත.

**පර්යේෂණ සීමාව**

ක්‍රි.ව. 15 වන සියවස මෙහි පර්යේෂණ සීමාව වන අතර, එම කාල සීමාවට ගැනෙන අභිලේඛන සහ සන්නස් අධ්‍යයනය කෙරේ.

**පර්යේෂණ සාකච්ඡාව/ප්‍රතිඵල**

වහලුන් විහාර සමඟින් අත්‍යන්තයෙන් බැඳී සිටින ස්වභාවයක් කෝට්ටේ යුගයේ දී හඳුනා ගත හැකි ය. කෝට්ටේ යුගයේ දී ඉඩම් ප්‍රදාන සමඟ සිදු වන බොහොමයක් වහල් ප්‍රදාන සිදු වී ඇත්තේ විහාරාරාම වෙත ය. පැපිලියාන ශිලාලේඛනයේ දක්වන ආකාරයට පරිවාර ජනයාගෙන් දෙසිය පණහක් පැපිලියාන විහාරයට පූජා කර තිබේ. ක්‍රි.ව. 1459 දී නැවත ගෑනු පිරිමි වහලුන්ගෙන් 20ක් පැපිලියාන් විහාරය සන්තක කරන ලද බව සඳහනි. රජවරුන් විසින් වහලුන් විහාරවලට ප්‍රදානය කිරීම ගැන දැක්වෙන සඳහන්වලින් පැන නඟින අදහසක් නම් වහල්භාවය විහාර මගින් ප්‍රයෝජනයට ගනු ලැබූ ශ්‍රම වර්ගයක් වීය යන්න යි. විශේෂයෙන් **සමන්තපාසාදිකාව** වැනි මූලාශ්‍රයවල භික්ෂූන් විසින් දාසයන් භාරගනු ලැබීම තහනම් කර තිබෙනු දක්නට ලැබේ. විශේෂයෙන් ශිලාලේඛනවල ඇතැම් විට දාසත්වයෙන් හෙවත් වහල්භාවයෙන් මුදවා ගැනීම පිළිබඳ ව සඳහන් කර තිබේ. එහෙත් මධ්‍යතන යුගයේ දී විහාරාරාමවල වහල් ක්‍රමය ව්‍යාප්ත ව පැවති බව නිසැක ය. එතුළින් ගම්‍යමාන වන්නේ වහල් පිරිවර විහාර ඉඩකඩම්වලින් වෙන් කළ නො හැකි දේපළක් ලෙස පිළිගැනීමට ලක්වී ඇති බව යි. කෝට්ටේ යුගයේ විවිධ ප්‍රදානයන්ට භාජනය වූ වහල් දාසිදස් පරපුර ඉඩම් භුක්තිය තුළ කරන ලද කාර්යභාරය කුමක් ද යන්න පිළිබඳ ව ද මූලික අවධානය යොමු කළ යුතු ව තිබේ. ගලපාත ලිපියට අනුව එකී වහල් ජනයා පුදා ඇත්තේ භික්ෂූන් වහන්සේගේ අත්පා මෙහෙවර සඳහා ය. ලංකාතිලක විහාර ශිලාලිපියේ එකී විහාරයට වහල් ජනයා 200කට ආසන්න ප්‍රමාණයක් පරිත්‍යාග කරමින් "**විහාරයේ කළ දේ වච නො කළ දේ කරව**"යි දක්වා තිබේ. එහි අදහස වන්නේ සිදු කොට ඇති විහාර කර්මාන්ත වැඩිදියුණු කළ යුතු බවත්, කළ යුතු ව ඇති එහෙත් නො කරන ලද කර්මාන්ත සිදු කළ යුතු බවත් ය.

කෝට්ටේ යුගයේ සන්නස්වලින් හෙළිවන තොරතුරු පරීක්ෂා කරන විට 'වහලුන්' ප්‍රධාන වශයෙන් ම අදාළ ආගමික මධ්‍යස්ථානයේ හෝ ආගමික නායකයා සතු දේපළක් බවට පත්ව තිබූ ආකාරය හඳුනා ගත හැකි වේ. එහෙත් වහලුන් විහාරයේ වහලුන් බවට පත් වූයේ ප්‍රදානය සිදු කළ තැන සිට ය. එසේ ම පිදීමට අවකාශ පැවතියේ ද ප්‍රදානය සිදු කරන්නා යටතේ මෙම වහලුන් සිටි නිසා ය. නො එසේ නම් 'වහලුන්' පිළිබඳ අයිතියක් ඉඩම් හිමියාට තිබූ නිසා ය. ගලපාත ලිපියේ දක්වන ආකාරයට කහඔල් කුලු මිදෙල්නා ඇතුළු පවුලේ අයට වහලුන් අයිති වන්නේ අන්වයාගත හා රන්වහල් යන ක්‍රම දෙකකිනි. 'අන්වයාගත වහල්' යනු අන්වයෙන් පැමිණි එනම් පරම්පරාවෙන් පැමිණි වහල් අයිතිය යි. වහලුන්ගේ අයිතිකාරත්වය හිමි කරගත හැකි අනෙක් ක්‍රමවේදය නම් රන්වහල් ක්‍රමය යි. ගලපාත ලිපියේ දක්වන ආකාරයට එහි එන ප්‍රභූ පවුල් තමන් සතු මුදලින් මෙන් ම මුද්‍රා තබන ලද සේප්පුවෙන් මුදල් ගෙන ද වහලුන් මිලයට ගෙන තිබේ. ක්‍රි.ව. 1432 නිකුත් කරන ලද පරිවාර ජනයාගේ නාමාවලියෙහි වඩුවලි අරශකොඩ ආචරියා ඇතුළු නම් සයක් පණම් හයසියයකට මිලට ගත් බව කියයි. වහලුන් මිල දී ගැනීම් පිළිබඳ මෙකී නාමාවලියෙහි දක්වා තිබුණත් විහාර දාසයන් විකිණීම හා මිලට ගැනීම නීතියෙන් තහනම් කළ බවට තොරතුරු පැපිළියානේ ශිලාලේඛනයෙන් ම ඉදිරිපත් වේ. **"විහාර පිළිබඳ ගම් කුඹුරු මිනිසා සතා ගරු භාඩ නො විකුණනුවත්, කිසිකෙනෙකුන් විසින් නො ගනුවත්"** ඇතැම් විට මෙයින් අදහස් කරන්නට ඇත්තේ විහාරයට දාසයන් මිල දී ගැනීමට නො ව විහාරයෙන් දාසයන් මිල දී ගැනීමට හෝ විහාර දාසයන් විකිණීමට නීතියෙන් තහනම් වන බව ය. විහාර කාර්යයන් සඳහා පවරා දීමට දාසයන් මිල දී ගැනීම තහනම් නො වන්නට ඇත. මීට වඩා තොරතුරක් මේ සම්බන්ධයෙන් ඉදිරිපත් වන්නේ නැත.

**පර්යේෂණ නිගමනය**

කෝට්ටේ යුගයේ ඉඩම් භුක්තිය සමඟ අත්‍යන්තයෙන් බැඳී සිටි වහලුන් පිළිබඳ ව මෙතෙක් කරන ලද සාකච්ඡාවේ දී පැහැදිලි ව පෙනී ගිය කරුණක් නම් මධ්‍යතන යුගයේ දී විහාරාරාම ආශ්‍රිතව සිටි සේවක පිරිස් වහල්, දැසිදස්, පිරිවර ජනයා, මිනිස් නිල ආදී යෙදුම්වලින් හඳුන්වා ඇති බව ය. ඔවුන් ආරාම සතු ඉඩම් අඳ ක්‍රමයට වගා කරමින් භික්ෂූන්ගේ කුඳුමහත් අවශ්‍යතා පූරණය කරමින් කටයුතු කර තිබේ. ප්‍රදානය වූ වහල් ජනයා ද භික්ෂුව ඇසුරේ වැඩෙමින් පින්දහම් සහිත ජීවිතයක් ගත කරන්නට ඇති බව උපකල්පනය කළ හැකි ය.

**ප්‍රමුඛ පදඃ** අන්වයාගත වහල්, පරිවාර ජනයා, රන්වහල්, වහල්භාවය

**මූලාශ්‍රය**


- තිස්ස කුමාර, ආනන්ද (1992). **සිංහල සන්නස් සහ තුඩපත්**. කොට්ටාවඃ සාර ප්‍රකාශන හා මුද්‍රණ.
- රණවැල්ල, සිරිමල් (2014). **අභිලේඛන සහ සන්නස්**. ඇස්. බී. හෙට්ටිආරච්චි, ධර්මරත්න හේරත් (සංස්.). අනුත්තරාදේවි විද්‍යාලඞ්කාර.
- **සිරිමත් කෝට්ටේ**. ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහනගර සභාව. කොළඹඃ රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව.
- Rohanadeera, M. (ed.). (2007). **Inscriptions of Ceylon Vol. VIII.** Colombo: Department of Archaeology.
- Richards, H. (ed.). (1906). **Journal of Ceylon Branch of the Royal Asiatic Society Vol, XVIII**, 1903-1905. Ceylon: Acting Government Printer.